# අපි මීළඟ “හ” අකුර ලිවීමට සූදානම් වෙමු...

ශ්‍රේණිය :- 1 ශ්‍රේණිය
විෂය :- මව්බස
පාඩම :- අකුරු ලිවීම

කාර්‍ය පත්‍රිකා අංක 09, කාලය - අගෝස්තු

- සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව මඟින් සකසා ඇති “ගෙදර ඉඳන් - අකුරු කරමු” වීඩියෝව හෝ e-nenapiyasa.lk හි “ගෙදර ඉඳන් - අකුරු කරමු”වෙතින් ගුරුවරයා අකුර කියාදෙන පියවර නරඹා, වැඩිහිටියන් විසින් පහත පරිදි දරුවාට උපකාර කළ යුතුය.
- මෙම වීඩියෝව සබරගමුව පළාතේ සියලුම කොට්ඨාස අධ්‍යාපන කායර්ාල, කලාප අධ්‍යාපන කායර්ාලයෙහි ප්‍රාථමික ඒකකයෙන් Pen Drive, DVD රැගෙන ගොස් ලබාගත හැකිය.
- වීඩියෝවක් නොමැති දරුවන් සඳහා සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව මඟින් සම්පාදිත “අකුරු හුරුව” මුද්‍රිත ක්‍රියාකාරකම් සංග්‍රහය භාවිතා කල හැකිය.

# “හ” අකුර ලියමු

## පියවර -1

- **“හ” අක්ෂරය මුලට යෙදෙන වචන දෙකක් ,තුනක් හඬ නගා කියයි.**(සවන්දී කියවමු) මි. 20
- **මුලට යෙදෙන්නේ “හ” ශබ්දය බව හඳුන්වා දෙයි.** (උච්චාරණය කරමින්)
- **සවන්දීමට කියවමු**

සංයුක්ත තැටිය හොඳින් බලන්න පහත සඳහන් වචන දරුවාට කිහිපවරක් ඇසෙන්නට කියවන්න. එහිදී නිවැරදි උච්චාරණය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.අවශ්‍ය පරිදි නැවත නැවත කරන්න.

උච්චාරණය කර වචන පුහුණු වීම (වචන උච්චාරණය කිරීම සඳහා පමණි)

| | | | |
|---|---|---|---|
| ගග | ළඟ | සුළඟ | ගඟ |

ශබ්ද නගා දරුවාට ඇසෙන ලෙස කියන්න / දරුවා සමඟ කියන්න.

## පියවර -2

- අවකාශයේ (අහසේ) ලියමු (“හ” අකුර ශබ්ද කරමින් අවකාශයේ ලියමු) මි. 05

සංයුක්ත තැටියේ පෙන්වන පරිදි හිස් අවකාශයේ (අහසේ) කිහිපවරක් ලිවීමට සලස්වන්න.

## පියවර -3

- වැලි පිල්ලේ ලියමු (“හ” අකුර වැලිපිල්ල මත ලියයි) මි . 3



වැලි පිල්ල

➢ පළමුව ප්‍රමාණවත් පරිදි පිරිසිදු සියුම් වැලි සපයාගන්න

- ඔබ තෝරාගත් ස්ථානයක, නැත්නම් සුදුසු බඳුනක හෝ මිදුලෙහි/භාජනයක සියුම් වැලි ටික අතුරා ගන්න.
- දැන් සංයුක්ත තැටියේ පෙන්වන ලෙස සකසා ගත් වැලිපිල්ලෙහි හෝ මිදුලෙහි “හ” අකුර ලිවීමට දරුවා යොමුකරන්න.

## පියවර -4

- <u>හිදැස්පත තුළ අකුරු ලියමු</u> (“හ” අකුර හිදැස්පත මත ලියයි) (මි. 05)
- දැන් හිදැස්පත භාවිතා කරමින් “හ” අකුර හිදැස්පතෙහි ඇඟිල්ල ආධාරයෙන් ලිවීමට දරුවා යොමු කරන්න.

හිදැස්පත් කඩයෙන් මිලදී ගැනීම හෝ අහල් 6 X 6කාඩ්පත් සකසා ගත හැකිය

## පියවර -5

- **<u>පස්රුළ මත ලියමු.</u>** (පස්රුල් පොතක් මිල දී ගැනීම අවශ්‍ය වේ.)
  - <u>පස්රුළ මත</u> “හ” අකුර ලිවීම හා නැවත නැවත පස්රුළ මත ලිවීම (මි.25)
- **දැන් පස්රුලෙහි “හ” අකුර ලිවීමට දරුවා යොමු කරන්න.**(පස්රුල් පොත භාවිතා කරන්න.)
- **අකුර කිහිප වරක් ලියමු** (වැඩි වාර ගණනක් ලිවීම වඩාත් සුදුසුය).
  (වීඩියෝව හෝ අකුරු හුරුව පොත මඟින් උදව්ගන්න)

## පියවර -6

- <u>තනිරුළ මත ලියමු.</u>( “හ” අකුර තනිරුළ මත ලිවීම-වැඩි වාර ගණනක් ලියමු) (මි.15)
  - දැන් නිවැරදි ලෙස “හ” අකුර තනිරුලෙහි ලිවීමට යොමු කරන්න.

  “අකුරු” වීඩියෝව හෝ “අකුරු හුරුව ” පොත හොඳින් බලා දරුවාට තනිරුළ මත ලිවීමට හුරු කරවන්න.
  - නිතර උදව් කරමු.
  - දිරිගන්වමු.

### අතිරේක පියවර

- **විවිධ අකුරුවලින් ආරම්භ වන වචන සහිත පින්තූර කාඩ්පත් අතරින් “හ” අකුර මුලට යෙදෙන පින්තූර තේරීම ක්‍රීඩාවක් සේ දරුවා සමඟ කරන්න.**

### තක්සේරුව

- ඔබේ දරුවා නිවැරදිව “හ” අකුර ලිව්වා නම් මෙම සලකුණු එකකින් සුදුසු පරිදි  ,★ ,√ ලකුණු කිහිපයක් ලබා දෙන්න. (ස්ටිකර් කාඩ් භාවිතා කළ හැකිය.)
- ඔබේ දරුවා “හ” අකුර ලිවීමට උත්සහා කළා නම් මෙම සලකුණුවලින් එකක්  ,★ ,√ ලබාදෙන්න (ස්ටිකර් කාඩ් භාවිතා කළ හැකිය.)

**අවශ්‍ය නම් අමතර උදව් හා ප්‍රතිපෝෂණ අවස්ථා ලබා දෙන්න.**